පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.05 පැය1120 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1996/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**මුහුදේ පාවෙමින් තිබූ හැෂ් මත්ද්‍රව්‍ය තොගයක් සොයාගැනීම - පොලිස් විශේෂ කාර්ය බලකා කටුකුරුන්ද කඳවුර.**

2025.11.05 වන අද දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කටුකුරුන්ද කඳවුරේ නිලධාරින්ට ලද තොරතුරකට අනුව කළුතර දකුණ පොලිස් වසමේ කටුකුරුන්ද වෙරළට ආසන්න මුහුදු තීරයේ පාවෙමින් තිබූ මත්ද්‍රව්‍ය බවට සැක සහිත පාර්සල් 10 ක් සොයාගෙන ඇත.

මෙම මත්ද්‍රව්‍ය, පාර්සල් 10 ක අසුරා තිබී ඇති අතර පරීක්ෂා කිරීමේදී හැෂ් මත්ද්‍රව්‍ය බවට හඳුනාගෙන ඇති අතර **සම්පූර්ණ මත්ද්‍රව්‍ය ප්‍රමාණය කිලෝ 11 ග්‍රෑම් 759 ක් වේ**. මෙම මත්ද්‍රව්‍ය තොගයෙහි හිමිකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැත.

මත්ද්‍රව්‍ය තොගය වැඩිදුර විමර්ශන සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත ඉදිරිපත් කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**